ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන

5 වන මට්ටම 2020/2021

අවසාන පරීක්ෂණය - 2021

SNU5237/ESU3137 - අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පසුබිම

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2021.08.01 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. 'ප්‍රතිමාන යනු යම් කිසි සමාජයක පවත්නා අගයන්හි ප්‍රතිබිම්බයකි.' උදාහරණ සහිතව ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

02. ළමයින්ගේ සමාජානුයෝජනයේ ස්වාභාවය නිර්ණය කිරීමට සමාජය විසින් අවිධිමත්ව යොදා ගන්නා නිර්ණායක තුනක් (03) පැහැදිලි කරන්න.

03. 'විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ සමාජානුයෝජනය කෙරෙහි අදාළ පවුලේ සහෝදර සහෝදරියන් සංඛ්‍යාව තීරණාත්මක සාධකයක් වේ.'

    ඔබ ඉහත ප්‍රකාශය හා එකඟ වන්නේ ද? ඔබගේ පිළිතුරට හේතු තුනක් (03) දක්වන්න.

04. 'විශේෂ අවශ්‍යතා සහිත ළමයකුට අදාළව විධිමත් ප්‍රති සමාජානුයෝජනය' යන යෙදුම උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

05. ශ්‍රී ලංකාවේ දරුවන් හදා වඩා ගන්නා ව්‍යවහාරයන් තුළ දක්නට ලැබෙන ස්ත්‍රී පුරුෂ භාවයට අදාළ ප්‍රතිමාන මොනවා ද?

06. සමවිය සහයෝගිත්වය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

07. විශේෂ අවශ්‍යතා සහිත ළමයින් මාධ්‍යය කෙරෙහි ඇබ්බැහි වීමට හේතු පහක් (05) පැහැදිලි කරන්න.

08. ‘විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ සමාජානුයෝජනය කෙරෙහි න්‍යෂ්ටික පවුලේ සිරස් සහ තිරස් ව්‍යාප්තිය වාසිදායක වේ.’

ඉහත ප්‍රකාශය උදාහරණ සහිතව සාධාරණීකරණය කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. I. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ දෙමාපියන් තම දරුවන් සම්බන්ධව මුහුණපාන ගැටළු මොනවාදැයි උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 10)

II. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ දෙමාපියන් තම දරුවන් සමාජානුයෝජනය කිරීමට භාවිතයට ගනු ලබන උපාය මාර්ග මොනවා ද?
(ලකුණු 10)

10. I. ‘අනෙකාගේ භූමිකාව ගැනීම’ යන්න පහත දැක්වෙන ළමා වර්ගවලට අදාළව කෙතෙක් දුරට අභියෝගාත්මක වන්නේ ද?

අ. අන්ධ ළමයි

ආ. බුද්ධිමය දුබලතා සහිත ළමයි (ලකුණු 10)

II. ගුරුවරයකු වශයෙන් ඔබ ‘අනෙකාගේ භූමිකාව ගැනීම’ යන්නට අදාළව ඉහත දක්වන ලද ළමයින් සම්බන්ධයෙන් මැදිහත් වන්නේ කෙසේ ද?
(ලකුණු 10)

11. I. නිදහසට හා කැමැත්තට ඉඩ දෙන දෙමාපිය ශෛලිය යටතේ හැදී වැඩුණු ළමයින් පහත දැක්වෙන ලක්ෂණ පෙන්නුම් කළ හැකි ය.

පහළ ආත්ම පාලනය, අපේක්ෂා භංගත්වයන් දරා ගැනීමට අදාළ කුසලතා අවමවීම, වගකීම් දැරීමට අදාළ කුසලතා අවම වීම

ඉහත දක්වන ලද දෙමාපිය ශෛලියට අදාළව ළමයින් පෙන්වන මෙම ගති ලක්ෂණ සාධාරණීයකරණය කරන්න. (ලකුණු 10)

II. Bronfenbrenner ට අනුව ළමයින් හදා වඩා ගැනීමේ ක්‍රම කෙරෙහි සමාජ පන්තියේ බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. I. 'සමවයස් කණ්ඩායම්වල ප්‍රතික්ෂේපයට බඳුන්වීම විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ පෞරුෂ සංවර්ධනයට දිගු කාලීන බලපෑමක් ඇති කරයි.'

උක්ත ප්‍රකාශය පරීක්ෂා කරන්න. (ලකුණු 10)

II. විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ ප්‍රජානන, සමාජ හා චිත්තවේග සංවර්ධනයට සමවයස්කයින්ගේ ප්‍රතික්ෂේපයට බඳුන් වීමේ බලපෑම විභාග කරන්න. (ලකුණු 10)

13. I. සමාජානුයෝජන දෘෂ්ටි කෝණයෙන් විශේෂ පාසල්වල ලබාදෙන විශේෂ අධ්‍යාපනයට එදිරිව අන්තර්කරණ අධ්‍යාපනයේ ප්‍රතිලාභ අගයන්න. (ලකුණු 10)

II. අන්තර්කරණ අධ්‍යාපනය තුළින් ඔබ විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ සමාජානුයෝජනයට පහසුකම් සලස්වන්නේ කෙසේ ද? (ලකුණු 10)

14. I. ළමයින්ගේ ධනාත්මක සමාජ සචලතාවය කෙරෙහි බලපාන සාධක පැහැදිලි කරන්න. (ලකුණු 10)

II. ඉහත දක්වන ලද ඕනෑම සාධක දෙකක් (02) තෝරාගෙන ඒවා විශේෂ අවශ්‍යතා සහිත ළමයින්ගේ ධනාත්මක සමාජ සචලතාවයට බලපාන්නේ කෙසේදැයි උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.